# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/26 – 2016 මාර්තු 30 වැනි බදාදා – 2016.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 47 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2015/WS/164.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/5/27.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, කුරුණෑගල.

2. **ඉඩමේ විස්තරය.** – වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 837, කුරුණෑගල නගරය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මඩමේගම (කොට්ඨාස අංක 11 කුරුණෑගල මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KU/KRN/2015/669 හා 2015.12.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0708 ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබලි දෙකට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – දන්ගහකුඹුර ගලගාවකුඹුර, වරි. අංක 172/2 – ප්‍රමාණය: හෙක්. 0.0514 ක් පමණ**
උතුරට: ගල සහිත රජයේ ඉඩම සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: කැබලි අක්ෂර බී සහ එම්. කිත්සිරි හිමිකම් කියන ගොඩ ඉඩම සහ වගුරු බිම; බටහිරට: එම්. කිත්සිරි හිමිකම් කියන ගොඩ ඉඩම සහ වගුරු බිම.

02. **කැබලි අක්ෂර 'බී' – දන්ගහකුඹුර ගලගාවකුඹුර, වරි. අංකය නොදනී – ප්‍රමාණය: හෙක්. 0.0194 ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: ඇළ; දකුණට: නගර සභා මාර්ගය; බටහිරට: ටී. ජේ. පී. සිල්වා හිමිකම් කියන ලඳු කැළය සහ වගුරු බිම.

04 - 600

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2016 අංක 50 දරන ආඥාව**

මගේ යොමු අංකය: J/76/E/539.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/2/3/24.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 මාර්තු මස 23 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, කුලියාපිටිය-බටහිර.

2. **ඉඩමේ විස්තරය. –** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, මයුරාවතී කෝරළේ සුළු කොට්ඨාසයේ, ඉහල ඉඟුරුවත්ත (අ.ග.පි. 929) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 1978.03.28 දින පිළියෙළ කරන ලද අ.ග.පි. 929 පිඹුරෙහි කැබලි අක්ෂර "අ" වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් රූඩ්. 1 පර්. 07.2 ක් පමණ වන පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'අ' – කුරුදෙනිය පිල්ලෑව – ප්‍රමාණය: රූඩ්.1පර්.07.2**
උතුරට: ගම්සභා පාර; නැගෙනහිරට: කුරුදෙනිය පිල්ලෑව; දකුණට: ඇහැටුගහමුලහේන; බටහිරට: කොස්ගහමුලවත්ත සහ කැබලි අංක 25.

04 - 601

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2016 අංක 51 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/98/E/228. .
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KOLDS/LND/05/ACQ/22.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 මාර්තු මස 23 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, කොලොන්න.

2. **ඉඩමේ විස්තරය. –** සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොලොන්න ගම් පත්තුව සුළු කොට්ඨාසයේ කැල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2005.07.28 දින පිළියෙළ කරන ලද අ.ග.පි. 905 පිඹුරෙහි කැබලි අංක 1005 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.767 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1005 – මැදගොඩේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.767**
උතුරට: කැබලි අංක 152 සහ 154; නැගෙනහිරට: කැබලි අංක 154, 153 සහ 152; දකුණට: කැබලි අංක 153 සහ 152; බටහිරට: කැබලි අංක 152.

04 - 602

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2016 අංක 48 දරන ආඥාව**

මගේ යොමු අංකය: J/77/E/436.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/2/1/34 .

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 මාර්තු මස 17 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, දොම්පේ.

2. **ඉඩමේ විස්තරය. –** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, 401- දෙකටන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දෙකටන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2015.10.16 දින පිළියෙළ කරන ලද ගම් 68 මූලික පිඹුරෙහි කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.4105 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – කටුලන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.4105**

උතුරට:ආනන්ද අභයවර්ධන හිමිකම් කියන කටුලන්ද වත්ත මු.පි.කො. 5068 හි කැබලි අංක 1 සහ මු.පි.කො. 107හි කැබලි අංක 1; නැගෙනහිරට: මු.පි.කො. 5068 හි කැබලි අංක 1 සහ මු.පි.කො. 107හි කැබලි අංක 1 සහ මු.පි. A2521හි කැබලි අංක 1; දකුණට සහ බටහිරට: ඇම්. පී. තැඹිලියා හිමිකම් කියන දෙල්ගහවත්ත සහ ආනන්ද අභයවර්ධන හිමිකම් කියන කටුලන්දවත්ත.

04- 603

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.